# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.25 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 139 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව, 2025.01.24 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ විමලසිරිද මෙල් මාවත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මත්ද්‍රව්‍ය ඇතුලු පහත දේපල සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන සේනානායක මාවත, දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**අත්අඩංගුවට ගත් දේපල**

- ඇෂ් මත්ද්‍රව්‍ය කිලෝ 03 ග්‍රෑම් 349
- කුෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25
- මැන්ඩි මත්ද්‍රව්‍ය ග්‍රෑම් 30
- මත්පෙති 320
- මත් මුද්දර 129
- වායු පිස්තෝල අවි 01
- කඩු 02
- පොලිතින් සීලර් 01
- විද්‍යුත් තරාදි 05
- මත්ද්‍රව්‍ය ඇසුරුම් කිරීමට යොදා ගන්නා පැකට් 4000
- මුදල් රුපියල් 1250/=
- ජංගම දුරකතනයක්
- කාර් රථයක්

සැකකරු රක්ෂිත බන්ධනාගාර ගතව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මෙහෙයවීම මත මත්ද්‍රව්‍ය බෙදා හරින පුද්ගලයෙකු බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූපයක්




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**